# රට පුරාම LANKAQR සමාරම්භක උත්සවය

2020 ඔක්තෝම්බර් 05

ස්කෑන් කරන්න

## ගරු අග්‍රාමාත්‍යතුමාගේ පණිවිඩය



LANKAQR ඩිජිටල් ගෙවීමේ ක්‍රමය සමාරම්භ කරන මෙම අවස්ථාවේ මාගේ පණිවිඩය යොමු කිරීමට ලැබීම මහත් සතුටකි. මෙම ශතවර්ෂය ආරම්භයේ සිටම ශ්‍රී ලංකාව නව්‍ය ගෙවීම් පද්ධතීන් ස්ථාපනය කිරීමේ අරමුණ කෙරෙහි ශක්තිමත් ලෙස ගමන් කරමින් සිටී. මෙම ක්‍රියාවලිය තුළ කලාපයේ දියුණුම ගෙවීම් පද්ධතීන් ස්ථාපනය කිරීමට අප සමත් ව ඇත.

අන්තර්ජාල භාවිතයේ සහ සුහුරු උපාංග (Smart Devices) භාවිතයේ ස්ථාවර ඉහළ යාමට සමගාමීව මූල්‍ය ක්ෂේත්‍රයේ නවෝත්පාදනයන්ගේ වේගවත් වීමක් දක්නට ඇත. මෙය මූල්‍ය තාක්ෂණික කේෂත්‍රයේ නවෝත්පාදකයන් මූල්‍ය අන්තර්ගතභාවය වඩාත් යහපත් තත්වයකට ගෙන ඒම සඳහා අවශ්‍ය වන නව තාක්ෂණයන් කෙරෙහි වඩා නැඹුරු වීමට ද හේතු වේ.

ගෙවීම් ක්‍රමවේද සම්බන්ධ ඩිජිටල් තාක්ෂණික නවෝත්පාදනයන්, ප්‍රධාන ධාරාවෙන් පිටත වෙළඳ ප්‍රජාව නව තාක්ෂණික යුගය සමඟ සම්බන්ධ කර ගැනීමටත්, ආර්ථික ක්‍රියාවලියෙන් බැහැරව සිටින පාරිභෝගික ප්‍රජාව සාමාන්‍ය ආර්ථික ක්‍රියාවලිය තුළට ගෙන ඒම සඳහාත් මග පාදන බවට දැඩි විශ්වාසයක් පවතී.

මෙම ක්ෂේත්‍රවල වර්ධනයන් ශ්‍රී ලංකාව පුරා පුළුල් පරාසයක මූල්‍ය සේවාවන් ව්‍යාප්ත කිරීමට හේතුවන අතර එහි ප්‍රතිඵලයක් ලෙස ආර්ථික වර්ධනය වැඩි වීම සහ සමාජීය විෂමතාවයන් අඩු වීම සිදු වනු ඇති බව අපේක්ෂා කරයි.

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ඩිජිටල් ගෙවීම් ක්‍රම ප්‍රචලිත කිරීම සඳහා දරන උත්සාහය, විශේෂයෙන්ම LANKAQR හඳුන්වාදීම, සියලුම ආකාරයේ පාරිභෝගික සහ වෙළඳ ප්‍රජාවන් ආවරණය කරමින් ඔවුන්ගේ අවශ්‍යතා සපුරාලීමට හැකිවන ක්‍රියාමාර්ගයක් වනු ඇති බව මා සතුටින් සඳහන් කරමි.

මාගේ අදහස වනුයේ අප සියලු දෙනා කටයුතු කළ යුතු වන්නේ එවන් අනාගතයක් සඳහා බවයි. මෙම ආරම්භය වඩාත් සංවර්ධනය වූ සහ සෞභාග්‍යමත් ශ්‍රී ලංකාවක් සඳහා වූ අරමුණ සාක්ෂාත් කර ගැනීම සඳහා තබන වැදගත් පියවරක් වනු ඇතැයි බලාපොරොත්තු වෙමි.

**මහින්ද රාජපක්ෂ**
ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදී සමාජවාදී ජනරජයේ අග්‍රාමාත්‍ය

## මුදල් හා ප්‍රාග්ධන වෙළඳපල සහ රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිසංස්කරණ රාජ්‍ය අමාත්‍ය තුමාගේ පණිවිඩය



දිනෙන් දින ඩිජිටල්කරණය වන ලෝකයක, අපගේ එදිනෙදා ජීවිතයේදී අප තාක්ෂණය මත රඳා පවතින තත්වයකට පත්ව ඇත. අප මිනිසුන් සමඟ කටයුතු කරන ආකාරය, අප වැඩ කරන ආකාරය සහ අපගේ ජීවන රටාවන් පවා වෙනස් වී ඇත්තේ තාක්ෂණයේ බලපෑම හේතුවෙනි. එබැවින් අප එකිනෙකාට ගෙවීම් කරන ආකාරයද දැන් සැලකිය යුතු ලෙස වෙනස් වී තිබීම පුදුමයක් නොවේ.

මහ බැංකුව, වාණිජ බැංකු, මූල්‍ය ආයතන, මූල්‍ය නවෝත්පාදන කරන දුරකතන සමාගම් සහ ෆින්ටෙක් (FinTech) සමාගම් එක්ව LANKAQR දියත් කිරීම තුළින් සුරක්ෂිත හා පහසු ඩිජිටල් ගෙවීම් ජනතාව වෙත ගෙන ඒමට මහ බැංකුව ගන්නා මෙහෙවර පිළිබඳව මම සතුටු වෙමි.

මෙම පාර්ශවකරුවන් එකතු වීම පිළිබඳව ඉතා සතුටු වන අතර, ඔවුන් සියල්ලන්ටම සාර්ථකත්වය ප්‍රාර්ථනා කරමි.

**අජිත් නිවාඩ් කබ්රාල්**
රාජ්‍ය අමාත්‍ය
මුදල් හා ප්‍රාග්ධන වෙළඳපල සහ රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිසංස්කරණ

**ඔබගේ සියළුම ගෙවීම් වේගයෙන් සහ පහසුවෙන් සිදු කර ගැනීමට ඔබගේ ජංගම ගෙවීම් මෘදුකාංගය (Mobile Payment App) භාවිතා කර LANKAQR කේතය ස්කෑන් කරන්න**

## ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපතිතුමාගේ පණිවිඩය



ඩිජිටල් ක්‍රමවේද ලොව පුරා අද පොදු සංසිද්ධියක් බවට පත් වී ඇත. ඊට සමගාමීව, ශ්‍රී ලංකා මහ බැංකුව ගෙවීම් ක්‍රමවේදයන් නවොත්පාදනය කිරීමේ කර්තව්‍යයෙහි බොහෝ දුරක් මේ වන විට ගමන් කොට ඇත. විශ්වාසවන්තභාවය හා සුරක්ෂිතභාවය සම්බන්ධයෙන් ජාත්‍යන්තර ප්‍රමිතීන් හා සම වූ ඉතා උසස් ගෙවීම් පද්ධතියකට අප රට හිමිකම් කියන බැව් සාඩම්බරයෙන් ප්‍රකාශ කිරීමට මෙය අවස්ථාවක් කර ගනිමි. අපගේ උත්සාහය වනුයේ සාම්ප්‍රදායික මුදල් පදනම් කරගත් ගනුදෙනු ක්‍රමයෙන් ඩිජිටල් ගනුදෙනු ක්‍රම වෙත පරිවර්තනය කරවීමයි.

තාක්ෂණයට, නිර්මාණශීලීත්වයට සහ නව නිපැයුම්වලට ප්‍රමුඛත්වය දෙන නූතන යුගයේ, 'පහසුව' යන සංකල්පයට අපගේ ජීවිතවල ඉහළ වටිනා කමක් හිමිවේ. අප කොපමණ සම්පත් සහ උත්සාහය යොදවා ඇතත්, සමාජයේ සියලුම මට්ටම් වලට ගෙවීම් ක්‍රමවල පහසුව අත්ව පවතින්නේද යන්න තවදුරටත් ප්‍රශ්නයකි. එසේම සාමාන්‍ය මහජනතාවගේ ජීවන තත්ත්වය නගා සිටුවීම සඳහා අවශ්‍ය කටයුතු සම්පාදනය කිරීම ශ්‍රී ලංකා මහ බැංකුවෙහි වගකීමක් වේ. එම වගකීමට මූලිකත්වය දෙමින් ශ්‍රී ලංකා මහ බැංකුව 2020 වසර "ඩිජිටල් ගනුදෙනු වර්ෂය" ලෙස නම් කර ඇත. එහි අරමුණ වුයේ මහජනතාව සහ ව්‍යාපාර අතර ඩිජිටල් ගනුදෙනු ප්‍රචලිත කිරීම තුළින් ඩිජිටල් මූල්‍ය අන්තර්ගෘහිතභාවය වැඩි දියුණු කරවීමය.

ඩිජිටල් ගෙවීම් පහසුකම් පතුරුවා හැරීමේ ප්‍රශ්නයේදී දේශීය බැංකු සහ මූල්‍ය ආයතන විශාල වශයෙන් අප හා අත්වැල් බැඳ ගැනීම භාග්‍යයක් ලෙස සලකමු. අන්තර් ක්‍රියාකාරීත්වය සහ කාර්යක්ෂම ඩිජිටල් ගෙවීම් සඳහා ප්‍රමිතීන් පවත්වා ගැනීම පමණක් ප්‍රමාණවත් නොවන අතර, එම ගෙවීම් යාන්ත්‍රණයන් ක්‍රියාත්මක කිරීමට හැකි සහ ඒ සඳහා කැමැත්ත තිබෙන, එම පහසුකම් වෙළඳුන් සහ පාරිභෝගිකයන් වෙත ගෙන යා හැකි ආයතන ද තිබිය යුතුය. මාගේ ප්‍රාර්ථනය වනුයේ ශ්‍රී ලංකා මහ බැංකුව මූලාරම්භය දී ඇති මෙම කාර්ය සඳහා බැංකු සහ අනෙකුත් මූල්‍ය ආයතන උද්යෝගයෙන් එක් වී සමාජයේ සියලුම කොට්ඨාශයන් කෙරෙහි ඩිජිටල් ගෙවීම් ක්‍රමවේදයන් ප්‍රචලිත කිරීම තුළින් අපගේ අවසාන අරමුණ වන සාමාජීය පහසුව සහ ආර්ථික සංවර්ධනය සාක්ෂාත් කර ගත හැකි වේවායි යන්නය.

**දේශමාන්‍ය මහාචාර්ය ඩබ්ලිව්. ඩී. ලක්ෂ්මන්**
අධිපති
ශ්‍රී ලංකා මහ බැංකුව

## ශ්‍රී ලංකා මහ බැංකුවේ ගෙවීම් හා පියවීම් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂකතුමාගේ පණිවිඩය



අවම මුදල් භාවිතා වන සමාජයක් යන සංකල්පය සැලකිය යුතු කාලයක සිට ශ්‍රී ලංකා මහ බැංකුවේ, ගෙවීම් හා පියවීම් දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අරමුණක් වී තිබිණි. අවම මුදල් පරිහරණය සහ ඩිජිටල් ගෙවීම් වැඩි කිරීම පිළිබඳ මෙම දැක්ම එළදායී කර ගැනීම සඳහා ගෙවීම් සහ පියවීම් දෙපාර්තමේන්තුව වසර ගණනාවක් පුරා වෙහෙස නොබලා වැඩ කරන ලදී. 2020 වර්ෂය ඩිජිටල් ගනුදෙනු වර්ෂය ලෙස ප්‍රකාශයට පත් කිරීම මෙම උත්සාහයන්හි මෑතකදීම ගත් පියවරකි.

වෙළෙඳුන්ගේ සහ පාරිභෝගිකයින්ගේ අවශ්‍යතා පිළිබඳව සොයා බැලීමේදී ජාතික QR කේත ප්‍රමිතියක් කෙරෙහි අවධානය යොමු කිරීමේ තීරණය අවශ්‍ය හා කාලෝචිත විය. වර්තමානයේ වෙළෙඳපොලේ ඇති මුදල් සඳහා වන විකල්ප ගෙවීම් ක්‍රම බොහෝ වෙළෙන්දන්ට මෙන්ම පාරිභෝගිකයින්ටද එකසේ අධික මිලක් දැරීමට සිදුවේ. මෙයට අමතරව, දැනට පවත්නා මෙම ගෙවීම් ක්‍රම කුඩා හා මධ්‍යම වෙළෙඳපොල තුල බහුලව භාවිත නොකෙරේ. ශ්‍රී ලංකා මහ බැංකුව වශයෙන්, සියළුම ගනුදෙනුකරුවන්ට සහ වෙළෙඳුන්ට පහසු සහ මුල්‍ය අන්තර්ගතභාවය සහතික කරන ගෙවීම් ක්‍රම හඳුන්වා දීම අපගේ වගකීමකි.

ඕනෑම නව ගෙවීම් ක්‍රමයක් හඳුන්වා දීමේදී මෙම වේගවත් සහ පහසු ගෙවීම් ක්‍රම පිළිබඳව ද පාරිභෝගිකයින් සහ වෙළෙඳුන් අතර අඩු අවබෝධයක් තිබිය හැකිය. මෙම කාරණය පිළිබඳව දැනුවත්ව සිටින ශ්‍රී ලංකා මහ බැංකුව, "රටපුරාම LANKAQR" වැනි මහජනතාව දැනුවත් කිරීමේ වැඩසටහන් තුලින් LANKAQR පිළිබඳව පුළුල් ලෙස දැනුවත් කිරීමට සහ එහි භාවිතය සහතික කිරීමට කැපවී සිටී. අපගේ ප්‍රයත්නයන් මෙන්ම, මෙය හඳුන්වා දීමෙහි නිරත වී සිටින බැංකු, මුල්‍ය ආයතන, විද්‍යුත් මුදල් පහසුකම් සපයන දුරකතන සමාගම් සහ ෆින්ටෙක් සමාගම්හි ප්‍රයත්නයන් ද නිසා වැඩි වශයෙන් ඩිජිටල් ගනුදෙනු මත පදනම් වු රටක් ඇති කිරීමට හැකි වනු ඇතැයි අපි විශ්වාස කරමු.

**ධර්මශ්‍රී කුමාරතුංග**
අධ්‍යක්ෂක, ගෙවීම් හා පියවීම් දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා මහ බැංකුව

1950-2020 Stability Sustainability Shared Prosperity

**ශ්‍රී ලංකා මහ බැංකුවේ, ගෙවීම් හා පියවීම් දෙපාර්තමේන්තුව විසින් හඳුන්වා දෙනු ලබන තවත් ඩිජිටල් ගෙවීම් ක්‍රමවේදයක්**

**ගෙවීම් සහ පියවීම් දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා මහ බැංකුව**
අංක. 30, ජනාධිපති මාවත, කොළඹ 01
0112477642

**වඩාත් ආරක්ෂිත හා වේගවත් ඩිජිටල් ගෙවීම් ක්‍රමවේදයන් දිරිගැන්වීම උදෙසා**